# ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
# விளையாட்டு மற்றும் இளைஞர் விவகார அமைச்சு
# Ministry of Sports and Youth affairs


**මාධ්‍ය නිවේදන අංක 475**
**2023.05.11**

**ක්‍රීඩා අමාත්‍ය රොෂාන් රණසිංහ මහතා හා ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ උප සභාපති ඉම්රාන් කවාජා මහතා සමඟ සාකච්ඡාව.**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය වෙත ගොස් කල දැනුම්දීමකට අනුව ඔවුන් වෙත දේශපාලන බලපෑම් ඇතිදැයි සොයා බැලීමට ත්‍රි පුද්ගල කමිටුවක් පත් කර ඇති බව ජනමාධ්‍ය හරහා දැනගැනීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් සඳහා තමන් සූදානම් බව ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය රොෂාන් රණසිංහ මහතා 2023.03.29 වන දින ලිපියක් මගින් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය වෙත දන්වා යවා ඇත.

එයට පිළිතුරු ලෙස ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය විසින් 2023.04.11 වන දින ලිපියක් මගින් මෙය රට තුළ ඇති ගැටලුවක් ලෙස හඳුනාගත් බවත්, ඒ සඳහා මේ මොහොතේ දී ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ මැදිහත්වීම අවශ්‍ය නොවන අතර සාකච්ඡාවක් ද අවශ්‍ය නොවන බවට ප්‍රකාශයක් නිකුත් කළ ද මැයි 10 වන දින ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ උප සභාපති ඉම්රාන් කවාජා මහතා ශ්‍රී ලංකාවට පැමිණ ඇති බවට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ක්‍රීඩා අමාත්‍යවරයා වෙත දැනුම් දීමක් සිදු කර ඇත.

දිවයිනට පැමිණි ඉම්රාන් කවාජා මහතා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිළධාරීන් සමඟ සාකච්ඡාවකින් පසුව ක්‍රීඩා අමාත්‍යවරයා සමඟ සාකච්ඡාවකට පැමිණෙන බව දැනුම්වත් කර ඇති අතර ජාත්‍යන්තර ක්‍රිකට් කවුසිලයෙන් මේ සම්බන්ධයෙන් නිළ වශයෙන් පෙර දැනුම්දීමක් සිදු කර නොමැති වුවත් ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය දැනුම්වත් කිරීමෙන් අනතුරුව අද (11) දින එම සාකච්ඡාව සඳහා වෙලාව වෙන් කර දී ඇත.

ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයට අපි ගරු කරනවා සේම අපේ රටේ නීතියට ද ගරු කරන ලෙස සාකච්ඡාව තුළදී ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ උප සභාපතිවරයාගෙන් ඉල්ලා සිටින ලදි. ඒ අනුව ඉදිරියට ද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ නිවැරදි දේ කිරීමට තමාගේ සහයෝගය ලබා දෙන බව ද පැවසීය.

ලෝකයේ ප්‍රමුඛස්ථානයේ සිටි ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම නැවත ලෝක කුසළානය සඳහා තරග කිරීමට තේරීම් තරගවලට මුහුණ දීම දක්වා කඩා වැටී ඇති ආකාරය පෙන්වා දුන් අමාත්‍යවරයා, ඒ තත්ත්වයෙන් නැවත නැගී සිටීමට කටයුතු කිරීම ශ්‍රී ලංකා ක්‍රිකට් හා සම්බන්ධ සියලු දෙනාගේ වගකීමක් බව ද පැවසීය.

ශ්‍රී ලංකා ක්‍රිකට් වෙනුවෙන් පාර්ලිමේන්තුවට හා ජනතාවට විෂය භාර අමාත්‍යවරයා ලෙස තමන් වගකීමට බැඳී සිටින බවද සිහිපත් කළ අමාත්‍යවරයා ඉදිරියේදී සියලු පාර්ශවයන් සමඟින් නිවැරදි සැළසුමක් සහිතව වැඩ කටයුතු කළ යුතු ආකාරය පැහැදිළි කර දුන්නේය.

මෙම සාකච්ඡාව සඳහා ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ උපායමාර්ගික ජ්‍යෙෂ්ඨ කළමණාකරු අම්මාර් ෂෙයික්, ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් ඒ.මුතුමාල, ජනාධිපති නීතිඥ ඩිනාල් පිලිප්, නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද, හිටපු ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩක සිදත් වෙත්තමුනි යන මහත්වරුන් එක්ව සිටියහ.

උක්ත පුවත ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරය කර ගැනීමට අවශ්‍ය කටයුතු සළසා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. ඔබ ලබාදෙන සහයෝගයට බෙහෙවින් කෘතඥ වෙමි.

එස්.විජිතා බස්නායක
මාධ්‍ය ලේකම්
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය


නො.09 , පිලිප් ගුණවර්ධන මාවත,කොළඹ 07. **இல. 09, பிலிப் குணவர்த்தன மாவத்தை, கொழும்பு 07**. No.09, Philip Gunawardana Mawatha, Colombo 07.

දුරකථනය / தொலைபேசி / Telephone: 011-2684287 /2683014
ඉ -තැපෑල / மின்னஞ்சல் / E -mail: moysmediaunit@gmail.com
වෙබ් / இணையதளம் / Web: www.moys.gov.lk